# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

ඩී. එස්. සේනානායක පාර, කොළඹ 05, ශ්‍රී ලංකා.

දුරකථන / ෆැක්ස් : 2556629  වෙබ් අඩවිය : www.slpia.lk  ඊ-මේල් : slpia@sltnet.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/35/21  ඔබේ අංකය :

2021.03.01

රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර මැතිතුමා,
ගරු මහජන ආරක්ෂක අමාත්‍ය,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
සුහුරුපාය,
බත්තරමුල්ල.

**<u>කෲර වධහිංසා වැළැක්වීමේ පනත යටතේ දැනට සිරගතවී සිටින පොලිස් නිලධාරීන්ට ජනාධිපති සමාවක් ලබා ගැනීම.</u>**

ශ්‍රී ලංකා පොලිසියේ, කෲර වධහිංසා වැළැක්වීමේ පනත යටතේ වැරදිකරුවන් වී දැනට 12 දෙනෙකු පමණ සිරගතවී සිටී. මෙම නිලධාරීන් නීතිය හා සාමය සුරක්ෂා කිරීම සඳහා තම රාජකාරිය සද්භාවයෙන් ඉටුකිරීමට යාමේදී ඇතිවූ යම් ගැටළු කාරී තත්වයන් හේතුවෙන් ඉහත පනත යටතේ නඩු පැවරීමට ලක්ව බන්ධනාගාර ගතවී හෝ සිරගතවී ඇත. **(නාම ලේඛණය ඇමුණුම 01 ලෙස යාකර ඇත.)**

මෙම නිලධාරීන් සම්බන්ධයෙන් අප සංගමය විසින් පරීක්ෂා කර බැලීමේදී, නිලධාරීන් බන්ධනාගාර ගතවීම / සිරගතවීම හේතුවෙන් නිලධාරීන්ගේ පවුල්වල ආර්ථික මට්ටම ඉතාමත් අයහපත් තත්වයට පත්ව ඇති අතර, ආර්ථික මෙන්ම සාමාජීය මට්ටමින්ද ඉතාමත් අසරණ භාවයට පත්ව ඇත.

එසේම ඉහත සඳහන් කාරණය හේතුකොට ගෙන දැනට සක්‍රීයව රාජකාරියේ යෙදී සිටින නිලධාරීන් හටද යහපත් මානසික තත්වයකින් යුක්තව රාජකාරී කිරීමට නොහැකි තත්වයක් නිර්මාණය වී ඇත. මෙය නීතිය හා සාමය සුරැකීමේ ක්‍රියාවලිය වෙත ඉමහත් බලපෑමක් ඇති කරනු ලැබ ඇති බව අපගේ විශ්වාසයයි. මෙකී කාරණාවල් සමස්ථ සමාජයේ යහපැවැත්ම උදෙසා අහිතකර ලෙස බලපානු ඇත.

එබැවින් කෲර වධහිංසා වැළැක්වීමේ පනත යටතේ සිරගතව සිටින පොලිස් නිලධාරීන් හට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව, ජනාධිපති සමාව ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසාදෙන ලෙස ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නෙමු.

මෙමගින් එම නිලධාරීන්ගේ පවුල්වලට හා ශ්‍රී ලංකා පොලිසියට ද විශාල සේවයක් සිදුවන අතරම, ඒ තුලින් ඉදිරියේදී පොලිස් නිලධාරීන් නොබියව හා නිසැකව රාජකාරී කිරීමට පෙළඹෙනු ඇති බව අපගේ විශ්වාසයයි.

මේ සම්බන්ධයෙන් හිටපු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද ලිපියේ පිටපතක් ඇමුණුම 02 ලෙස යාකර ඉදිරිපත් කරමි.

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

පිටපත:- මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජගත් ද අල්විස් මහතා / ගරු ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය.